රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක.27/94(1)

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1994 ජූලි මස 25 වෙනි දින.

සියළුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

<u>මධ්‍යම මට්ටමේ ඒකාබද්ධ කාර්මික සේවා ප්‍රතිව්‍යුහගත කිරීම.</u>

අංක:27/94 හා 1994.07.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අමතරවයි.

01. උක්ත චක්‍රලේඛයේ 04:01 ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කරනු ලැබේ.

04:01. පියවරෙන් පියවරට නැඹීමේ පදනම මත වැටුප් පරිවර්තනය කරනු ලැබේ.

04:01:01 වැටුප් වර්ධන දිනයන් නොවෙනස්ව පවතිනු ඇත.

04:01:02 නව වැටුප් වලට පරිවර්තනය කිරීමට පෙර 1994.06.30 දිනට හෝ ඊට පෙර උපයා ගෙන ඇති වැටුප් වර්ධක වර්තමාන වැටුප් පරිමාණ අනුව ලබා දිය යුතුය.

04:01:03 1994.07.01 දිනට හෝ ඉන් පසුව වැටුප් වර්ධක උපයාගනු ලබන අයට නව වැටුප් පරිමාණ අනුව වැටුප් වර්ධකයේ සම්පූර්ණ වටිනාකම ලබා දිය යුතුය.

02. මධ්‍යම මට්ටමේ ඒකාබද්ධ කාර්මික සේවාවේ II 'අ' පන්තියේ උපරිමයේ රැඳී සිටින නිලධාරීන්ට ද අංක 15/92 හා 1992.03.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් ලිපිකරු හා සමාන්තර සේවාවන්හි නිලධාරීන්ට දැනටමත් සලසා ඇති සහනයන් ලබා දිය යුතුය.

03. මධ්‍යම මට්ටමේ ඒකාබද්ධ කාර්මික සේවාවන් ඇති සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට ද මෙම චක්‍රලේඛ නියමයන් අදාළ කිරීමට අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් ක්‍රියා කළ යුතුය.

අ.කලේ/ (වයි.බී.පුස්සෙදෙනිය)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.